

# සුභාවිත ගීතයේ පරාභවය

**සුභාවිත ගීතයට
කණකොකා හැඬීමට පටන්
ගැණුනේ අනූව දශකයේ
අග භාගය පමණ වන
විට ය.**

**ක**ලාව වූ කලී ඈත අතීතයේ පටන් ම මානව වර්ගයාගේ පැවැත්ම හා බැඳී ඇති සුවිශේෂී වූ මාධ්‍යයකි. එදා සිට අද දක්වා ම කලාවට ලැබෙන්නා වූ ස්ථානය මෙතෙකැයි කියා, නිම කළ නොහැක. එයට හේතුව නම් සතුට, දුක, කඳුළ, සිනහව, විරහව, ආදරය, සෙනෙහස යනාදී එකී මෙකී සෑම හැඟීමක් ම කලාව හා අත්වැල් බැඳගෙන ඇති හෙයිනි. කලාව ගත්විට සංගීතය, නර්තනය, සිනමාව, සාහිත්‍යය, සිතුවම යනා දී වශයෙන් නානාප්‍රකාර වූ ප්‍රභේදනයට වර්ග කළ හැකි ය. ඒ අතරින් ගීතයට ද සැලකිය යුතු සුවිශේෂී ස්ථානයක් හිමි වේ.

**"ගීතය වූ කලී මනුෂ්‍ය චිත්ත සන්තානයේ
රසාස්වාදය සඳහා විවර ව ඇති ඉඩ හසරෙහි
එක් දොරටුවකි."**

ගීතය යන්න එලෙස අර්ථ දක්වනවා නම් එය නිවැරදි යැයි සිතමි.

වර්තමානයේ අපට අසන්නට, රස විඳින්නට ලැබෙන ගීත හා එදා අප අසා රස විඳි ගීත අතර විශාල පරතරයක් ඇති බව නම් අමුතුවෙන් කිව යුතු නැත. ගීතය බිහිවන්නේ අසා රස විඳීම සඳහා වූ ත්‍රිපුද්ගල සමාගමයකිනි.

PERMANENT REFERENCE

එබැවින් හොඳ ගීතයක් බිහිවීමේ දී සම්බන්ධිත පුද්ගල ත්‍රිත්වය ම හෝ එකම පුද්ගලයා හෝ ඊට අදාළ දායකත්වය උපරිමයෙන් දිය යුතු ය. එක් පාර්ශවයක් හෝ දුර්වල වුව හොත් සමස්ත ගීත නිර්මාණය ම අසාර්ථක වේ. කෙසේ හෝ වේවා සුභාවිත ගීතය (ගේය පද්‍යය) යනුවෙන් අදහස් කරනුයේ අර්ථ පූර්ණ වූ, භාෂා දෝෂ රහිත, සංගීතය මුසු සංක්ෂිප්ත ගීතාත්මක භාෂා ප්‍රකාශනයකට ය.

ගීතයේ උපත දෙස බලන කල් හි, ජන ගායනා විශේෂයක් වශයෙන් බිහිවන සමජාතිය (homogenous) සමාජ තුළ පාරම්පරිකව, සරල නාද මාලා ඔස්සේ නිරායාසයෙන් ගායනා වූ සරල මිනිස් කටහඬේ සිට ග්‍රැමෆෝන් තැටිය, කැසට් පටය, සංයුක්ත තැටිය හා අන්තර්ජාලය දක්වා වූ නූතන විද්‍යුත් මාධ්‍යය ඔස්සේ මිනිස් කටහඬ මුසු වූ සංගීත සංයෝජනයන් ද සහිත ව ප්‍රකට මානව ප්‍රකාශනයක් වශයෙන් ජනප්‍රිය ව ඇත.

දහනව වන සියවස මුල් භාගයේ දී පමණ ඇරඹි දකුණු ඉන්දියානු රාගධාරී සංගීතයේ ආභාසය ලබමින් සිංහල ගීතය දෙපයින් නැගී සිටින්නට ගත් උත්සාහය සුභාවිත ගීතයේ ළදරු කාලය ලෙසින් හැඳින්විය හැකි ය. ඉන් අනතුරුව ආනන්ද සමරකෝන්, සුනිල් සාන්ත, අමරදේව යන සිංහල ගීයේ මුල් තුන්කට්ටුව අරිසෙන් අහුබුදු, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ වැන්නවුන්ගේ පද රචනා ගායනා කරමින් සිංහල ගීතයේ වසත් සමය ජව සම්පන්න හා අර්ථ සම්පන්න කළහ. කුමාරතුංග මුනිදාස, හියුබත් දිසානායක වැනි ප්‍රතිභාපූර්ණ පුරෝගාමීන් විසින් ඇති දැඩි කළ සිංහල ගීතය මඩවල. ඇස්. රත්නායක, ඩෝල්ටන් අල්විස්, එදිරිවීර සරච්චන්ද්‍ර, මහගම සේකර, ධර්මසිරි ගමගේ, මර්සලීන් ජයකොඩි පියතම වැනි පුද්ගලයන්ගේ ස්පර්ශයෙන් හා ගුණ රුවින් හැඩ වී කරුණාරත්න අබේසේකර, ඩබ්ලිව්. ඒ. අබේසිංහ, අජන්තා රණසිංහ, සුනිල් සරත් පෙරේරා, සුනිල් ආරියරත්න, කුලරත්න ආරියවංශ, කුමාරදාස සපුතන්ත්‍රී වැනි දෙවන පරපුරේ විශිෂ්ටයින්ගෙන් මඟ අසාගෙන ප්‍රේමකීර්ති ද අල්විස්, සුනිල් ආර්. ගමගේ, රත්න ශ්‍රී විජේසිංහ, රඹුක්කන සිද්ධාර්ථ හිමි වැනි ප්‍රතිභා සම්පන්න ගී පද රචකයින්ගේ පන්හිඳෙන් වඩාත් ඔප්නැංවිණ. මෙම ගී පද රචකයින්ගේ ගී පද මාලා ශ්‍රාවකයා වෙත සමීප කරලීමට වික්ටර් රත්නායක, ටී. එම්. ජයරත්න, ගුණදාස කපුගේ, සනත් නන්දසිරි, සුනිල් එදිරිසිංහ, රෝහණ බැද්දගේ, අමරසිරි පීරිස්, එඩ්වඩ් ජයකොඩි, කරුණාරත්න දිවුල්ගනේ, නන්දා මාලනී, මාලනී බුලත්සිංහල, නීලා වික්‍රමසිංහ, ලතා වල්පොල, දීපිකා ප්‍රියදර්ශනි, චරිතා ප්‍රියදර්ශනී වැනි බොහෝ ගායක ගායිකාවන් රැසක් බිහිවීම අප ලැබූ භාග්‍යයකි.

කෙසේ හෝ වේවා සුභාවිත ගීතයට කණකොකා හැඬීමට පටන් ගැණුනේ අනූව දශකයේ අග භාගය පමණ වන විට ය. එසේ සිදුවනුයේ දෙවන හා තෙවන යුගයන් නියෝජනය කරන ඇතැමෙකු අතින් ම ලියවෙන ගීත හේතුවෙනි. එයට එක් නිදසුනක් ලෙස මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසින් මුල් කාලයේ ලියනු ලැබූ,

**"යොවුන් වසන්තයේ - දුහුල් වලාකුළේ**
**රැන් මුදාගෙන පාවී යනු මැන ඉගිල්ලිලා...."**

යන සරල සුමියුරු ගීයත්, ඔහු අතින් ම මෑතක දී ලියවෙන,

**"යනවා නම් අනේ මං අරන් - යන තැනකට යන්න රත්තරන්..."**

ගීතයත් පෙන්වා දිය හැකි ය. ප්‍රේමයේ සෞන්දර්ය රම්‍ය වූ සඳ එළියක් සේ අපට ළං කළ මහාචාර්යවරයෙකු තමා අත රැඳි පන්හිඳට හිතුවක්කාරකම් කිරීමට කෙසේ අවසර දුනිද්'යි සිතා ගැනීමට අසීරු ය. කෙසේ හෝ පැවසීමට තිබෙනුයේ මෙම වකවානුවට අයත් ඇතැම් පද රචකයින් විසින් දැන හෝ නොදැන සුභාවිත ගීතයේ ඛේදනීය පරිහානියට අඩු වැඩි වශයෙන් දායක වී ඇති බවයි.

එක් පසෙකින් මෙවන් අසාධාරණයක් සිදුවෙද්දී, තවත් පසෙකින් ආකස්මිකව පහළ වූ අසම්මත පද රචකයින් අතින් එක රැයින් ලියැවී අල්පශ්‍රැත නපුංසක හඬවලින් ගැයුණු දඩිබිඩි සංගීතය හා මුසු වූ ජනප්‍රිය ගී දහස් සංඛ්‍යාත ප්‍රමාණයක් වර්තමානයේ දී බහුල වශයෙන් අසන්නට· දකින්නට ලැබේ. ගීත සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වශයෙන් පිළිගැනෙන හැත්තෑව, අසූව දශකවලත් මෙවන් කුණාටු ගී කෙත හරහා හමා ගියා යැයි යමෙකුට තර්ක කළ හැකි ය. ඒ කෙසේ වෙතත් රටේ පිළිගත් සම්මතයන්ට, ව්‍යවහාරයන්ට, භාෂාවට, කලාවට හා සංස්කෘතියට ඉන් හානියක් සිදු වේ නම් ඒවා යහපත් නිර්මාණ ලෙස පිළිගත හැකි ද?

මඳකට අප වත්මන් ගීතය වෙත හැරෙමු. වර්තමානයේ ලියැවෙන ගීත දෙස බැලීමේ දී ප්‍රේමාලාප, අඳෝනා, විලාප විනා අලුතින් ගී ලිවීමට ඔවුන්ට අත්දැකීම් නැතුවා සේ හැඟී යයි. ගීයකට පාදක කරගත හැකි දෛනික අත්දැකීම් කොපමණ නම් අප රටේ සමාජයේ දක්නට ලැබේ ද? යමෙකු අන් සියල්ල බැහැර කොට ශෘංගාරාත්මක ප්‍රේමය ම ගීතයට උචිත යැයි පවසනවා යැයි සිතමු. ප්‍රේමය ගීතයට අපූරු ප්‍රස්තුතයක් බව සැබෑ ය. එයට හේතුව නම් ප්‍රේමයේ විෂය පථය මහා විශාල වූ ත්, ඉසව් ගණනාවකින් සමන්විත වූ නිසාත් ය. නමුත් අද ප්‍රේම ගීත යැයි ලියැවෙන්නේ ද ප්‍රේම විලාප සහ පෙම් අඳෝනාවන් ය. මේවා අසන්නන් හට දැනෙනුයේ පිළිකුලක් බව සැබෑ ය. නමුත් පසුගිය වසර විස්ස තිහ තුළ ලියවුන පෙම් ගීත කෙතරම් නම් අරුත්බර හා රසවත් භාවයකින් යුක්ත ද? මාගේ මතකයට නැගෙන්නා වූ එවන් ගීතයනට නිදසුන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

**"සඳැල්ලේ මිණි තලාවේ**
**තාරකා පිපි වෙලාවේ**
**ළඳ ලියන්ගේ සීන අතරේ**
**මැවේ ඒ රූපේ"**

- මහගම සේකර -

**"රෝස කටුව ළයේ ඇණුන කුරුල්ලානනේ**
**රෝස මලට පෙම් කළාට දඬුවමක් ද මේ"**

- රත්න ශ්‍රී විජේසිංහ -

**"ලේන කුලේ සිට ආ ගිය මඟ තොට**
**සිටියා නොසැලෙන පහන් ටැඹක් සේ**
**නිවන් දකින තුරු මේ සංසාරේ**
**පසුපස ආවා සෙවණැල්ලක් වී"**

- රඹුක්කන සිද්ධාර්ථ හිමි -

අද මෙන් නොව විරහ ගීතය වුව ද එකල ඉතා අර්ථවත් අයුරින් ලියැවුණි.

**"සැඳෑ අඳුර ලොව ගලන වෙලාවට**
**කවුළු පියන්පත් වැසෙන වෙලාවට**
**දහසක් දොම්නස් සිහින පවුරු මැද**
**තනිවුණ ඔබෙ සුසුමන් සෙමෙන් විත්**
**මගෙ සවනත පාරයි"**

**- සෝමතිලක ජයමහ -**

මෙවන් වූ සිත් නිවාලන ගීත අද වුව ද අසා මහත් වූ රසාස්වාදයක් ලබාගත හැකිය. නමුත් මෑතුවට ලියැවුණ ගීතයන් නම් සුභාවිත ගීතය නැත්තට ම නැති කිරීමට සමත් විය.

**"පාරමිතා නොපුරමු අප දෙදෙනා**
**- මතු මතු සංසාරේ**
**පාන සිනා සුළඟට මුසු කරමු**
**- උපදින හැම වාරේ"**

මෙහි 'අප නොපුරමු' යන්නෙහි පැහැදිලිව ම ව්‍යාකරණ දෝෂ දක්නට ලැබේ.

**"මට ඔබ ඔබ මට පෙම් කළ තරමට**
**වෙන් වී යන්න බැරි...."**

මෙම පද පේළිය වරක් හෝ දෙවරක් කියවා බැලූ කල එකම තැනැත්තෙකු පමණක් පෙම් කර ඇති බව හැඟී යයි.

සුභාවිත ගීතයට ක්‍රම ක්‍රමයෙන් සිදු වූ හානිය වර්තමානය වන විට සුභාවිත ගීතය නැත්තට ම නැතිකර දැමීමට සමත් වී ඇති බව මෙය කියවන ඔබට තේරුම් යනවා නොඅනුමාන ය. වර්තමානයේ දී අසන්නට ලැබෙන ගීත පිළිබඳ ව එම නිසා තවදුරටත් පැහැදිලි කිරීම නිෂ්ඵල කරුණකි. කෙසේ වුවද අපගේ මතුපිට කන මොහොතකට රවටන සෝෂාකාරී තනුවකට, ඉල්ලුමට සැපයුම සලසන ගීත කලාවකට බඩ පිනුම් ගසන්නට ඉඩ හැර සුභාවිත ගීතය ඛේදනීය තත්වයකට ඇද වැටෙන අයුරු, අපගේ සුභාවිත ගී පද රචකයන්, තනු රචකයන් හා ගායක ගායිකාවන් මෙසේ නිසොල්මන්ව උඩ බලා සිටින අයුරු දක්නා අප සිත් හි මහත් වූ ශෝචනීය හැඟීමක්, පැළ පදියම් වේ. එහෙයින් සුභාවිත ගීතයට මියැදෙන්නට ඉඩ නොහැර අළු ගසා දමා අවදි කරවීමට, මෙය කියවන පාඨක ඔබ ද අත්වැල් බැඳගනී යන්න මාගේ ඒකායන පැතුම යි.

රුවන්ති කෞශල්‍යා.